# සංඥාපනය

මේ බෝධි පූජා යුගයෙකි. පෙර කැරුණු බණ පින්කම් පිරිත් පින්කම් දැන් අඩු ය. දේව පූජාත් අඩු ය. දැන් බෙහෙවින් කෙරෙන්නේ බෝධි පූජා ය. සාස්තරකාරයා කේන්දර බලන්නා අපලයට දැන් නියම කරන්නේ බෝධි පූජාව ය. මන්ත්‍රීකම ලැබීමට, රැකියාව ලැබීමට, රෝග සුව කර ගැනීමට, ගොවිතැන හරියාමට, නඩුවෙන් බේරීමට, වෙළඳම දියුණු වීමට, තවත් නොයෙක් දෙයට මෙකල කරන්නේ බෝධි පූජාව ය.

බෝධි පූජා කරනත් එය කරවන කරන බොහෝ දෙනකුන්ට ඒ ගැන සෑහෙන දැනුමක් නැත. ඇතැම්හු බුදුන්ට වඳින ගාථාව හෝ පාඨය හෝ කියා බෝධියට වඳිති. බුදුනට මල් පුදන ගාථාව කියා බෝධියට මල් පුදති. බුදුනට පහන් පුදන ගාථාව කියා බෝධියට පහන් පුදති. බෝධි පූජාව බොහෝ ඵලදයක පින්කමක් වුව ද දැනුමක් නැතිව කරන්නවුන්ට එයින් නියම ඵලයක් නො ලැබේ. එහි නියම ඵලය ලැබීමට නම් බෝධි යන වචනයේ තේරුම දත යුතු ය. ගසකට ඒ නම ආරූඪ වූයේ කෙසේ ද? ඒ ගසෙහි ඇති පූජනීය භාවය කුමක් ද? ඒ ගසෙහි ඇති බලය කුමක් ද? ඒ ගසට වැඳුම් පිදුම් කිරීමෙන් ලැබෙන අනුසස කුමක්ද? වැඳීම කුමක්ද? කුමට කරන්නක් ද? එය කරන්නේ කෙසේ ද? පිදීම යනු කුමක් ද? පිදිය යුත්තේ කුමක් ද? පිදිය යුත්තේ කෙසේ ද? යන මේ කරුණු ගැන දැනුමක් ඇති ව බෝධි පූජාව කළ යුතු ය.

බෞද්ධයන් විසින් දත යුතු නොයෙක් කරුණු ගැන අප විසින් පොත් ලියා ඇති මුත් බෝධි පූජාව ගැන පොතක් ලියා නැත. අප වෙත පැමිණියා වූ ද නොයෙක් තැන්වල දී අපට

මුණ ගැසුණා වූ ද අපගේ පොත් කියවූ බොහෝ දෙනෙක් බෝධි පූජාව ගැන ග්‍රන්ථයක් පිළියෙළ කරන ලෙස අපට ආරාධනා කළහ.

දැනට අප සිටින්නේ අසූ එක් අවුරුදු වයසේ ය. පොත් ලිවීමට වුවමනා සිහිය, ඇස, අත යන මේවා දැන් ඉතා දුබල ය. එබැවින් අපි කලක් ම ලිවීම නවත්වා සිටියෙමු. බොහෝ දෙනකුන්ගේ ඉල්ලීම නිසා හැකි වුවහොත් අවසානය තෙක් ලිවීමේත් අපහසු වෙතහොත් නවත්වා දැමීමේත් අදහසින් මේ පොත ලිවීම ආරම්භ කෙළෙමු. කෙසේ හෝ මෙයත් ලියවිණ. **මේ පොත ලියා ඇත්තේ මෙකල බෝධි පූජා කරන්නවුන් ගේ අදහස් අනුව ඔවුනට සුදුසු පරිද්දෙනි. ඔවුන්ගේ අදහස් මුදුන් පත් කර ගැනීමේ මග දැක්වීම වශයෙනි.** මේ පොත කියවීමෙන් බොහෝ දෙනකුන්ට කලින් නො දැන සිටි බොහෝ දේ දැන ගන්නට ලැබෙනු ඇත. බෝධි පූජාව පිළිබඳ නොයෙක් ශාන්ති කර්ම කරන සැටි මෙහි දක්වා ඇත. ඒවා බලා තමන්ට රුචි ශාන්ති කර්ම තෝරාගෙන ඒවායින් ජනයාට ශාන්තිය සලසා දිය හැකි වනු ඇත.

බෝධි පූජාව උසස් කුශලයකි. එයින් ලැබෙන විපාක මේ ග්‍රන්ථයෙහි දක්වා ඇත. බෝධි පූජාව කුශලයක් වුව ද එය කරන බොහෝ දෙනකුන් ඉන් බලාපොරොත්තු වන්නේ අනාගත භවයන්හි ලැබෙන විපාකයක් නොව වර්තමාන භවයේ ම යම් කිසිවක් සිදුකර ගැනීම ය. බෝධි පූජාවෙන් වර්තමාන භවයේදී බලාපොරොත්තු වන දෙය ඉටු වන්නට ද පිළිවන. සමහර විට ඉටු නොවන්නටත් පුළුවන. සංසාරය අතිදීර්ඝ බැවින් බෝධි පූජාවෙන් ලැබෙන ඵලය බලාපොරොත්තු වුවත් නොවුවත් කවද හෝ ලැබෙන්නට පිළිවන. එය ලැබීමට හෝ නොලැබීමට බලාපොරොත්තු වීම හෝ නො වීම කරුණක් නොවේ. පව් කරන්නවුන් ඒවා කරන්නේ අපායට යෑමේ බලාපොරොත්තුවකින් නොවේ. එහෙත් ඔවුනට එයින් අපායට යෑමට සිදු වේ. බලාපොරොත්තු නුවුව ද කුශලයෙන් සුගතියට යෑමට සිදු වන බව ඒ න්‍යාය අනුව කිය යුතු ය. **කිසි පිනක් නො කොට මේ අගනා මනුෂ්‍යාත්මය නිෂ්ඵල කර ගන්නා අයට බෝධි පූජාවක් වුව ද කිරීම ඉමහත් යහපතකි.**

**කුශලය වනාහි ඥාන සම්ප්‍රයුක්ත කුශලය, ඥාන විප්‍රයුක්ත කුශලය යි දෙ පරිදි වේ.** ඉහත කී කරුණු ගැන දැනුමක් ඇති ව බෝධි පූජාව කිරීමේදී ඇති වන්නේ ඥාන සම්ප්‍රයුක්ත කුශලයෙකි. දැනුමක් නැති ව අනුන් කරන සැටි බලා කරන්නවුන්ට ඇති වන්නේ ඥාන විප්‍රයුක්ත කුශලයෙකි. එය දුබල කුශලයෙකි. අනාගත භවයේ දී එයින් ඇති වන්නේ ද ඥාන විප්‍රයුක්ත ද්විහේතුක හෝ අහේතුක ප්‍රතිසන්ධියෙකි. ද්විහේතුක ප්‍රතිසන්ධියෙන් උපන්නෝ ද්විහේතුක පුද්ගලයෝ නම් වෙති. අහේතුක ප්‍රතිසන්ධි-යෙන් උපන්නෝ අහේතුක පුද්ගලයෝ නම් වෙති. අහේතුක ප්‍රතිසන්ධිය ඇති වන්නේ වඩාත් දුබල ඥාන විප්‍රයුක්ත කුශලයෙනි. මිනිස් ලොව ඉපද සිටින උත්පත්තියෙන් ම අඞ්ග විකල පුද්ගලයෝ අහේතුක ප්‍රතිසන්ධිකයෝ ය. ඥාන විප්‍රයුක්ත දුබල කුශලයට අඞ්ග සම්පූර්ණ උත්පත්තියක් ලබා දීමට ශක්තියක් නැත. බලවත් ඥාන විප්‍රයුක්ත කුශලය අඞ්ග සම්පූර්ණ උත්පත්තියක් ලබා දීමට සමත් වේ. එහෙත් ඔවුහු ඥානය හීනපුද්ගලයෝ ය. ද්විහේතුක අහේතුක පුද්ගලයෝ භාවනා කළ ද බුදුවරයකු හමු වී දහම් ඇසුව ද, මහපල ලැබීමට ධ්‍යාන ලැබීමට සමත් නො වෙති. භාවනා කොට දහම් අසා සෝවාන් ආදි මහපල ලැබීමට සමත් වන්නෝ ඥාන සම්ප්‍රයුක්ත කුශලයාගේ විපාක වශයෙන් ලබන ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ලැබූ පුද්ගලයෝ ය. ද්විහේතුක ත්‍රිහේතුක පුද්ගලයන් වෙන් කොට හැඳින ගැනීමට විශේෂ ලකුණක් නම් නැත.

කරන කුසල්වල සම්පූර්ණ ඵලය ලැබෙන්නේ අනාගත භවවල දී ය. වර්තමාන භවයේ ලැබෙන්නේ විපාකවලින් ඉතා සුළු කොටසක් පමණෙකි. කරන කුශලය ඥාන විප්‍රයුක්ත දුබල කුශලයක් වුවහොත් එයින් වර්තමාන භවයේ දී කිසි ම ඵලයක් නො ලැබී යන්නට ද පිළිවන. බෝධි පූජාව ඥාන විප්‍රයුක්ත ව කරන්නවුන්ට එයින් ඔවුන් බලාපොරොත්තු වන වර්තමාන ඵලය නො ලැබී යා හැකි ය.

මේ පොත හොඳින් කියවා මෙහි ඇති කරුණු හොඳින් තේරුම් ගෙන බෝධි පූජාව කරත හොත් එයින් මෙලොවදී ම බලාපොරොත්තු වන දේ ද ඉටු කර ගත හැකි වනු ඇත.

බෝධි පූජාව පමණක් නොව වෙනත් කුශලයන් ද ඥාන සම්ප්‍රයුක්ත ව කළ හැකි වීමට මේ පොත ඔබට පිහිට වනු ඇත. මේ පොත මුද්‍රණයේදී ද අපගේ ශිෂ්‍ය ශාස්ත්‍රාචාර්ය **හේන්-ගොඩ කල්‍යාණධම්ම** ස්ථවිරයන් සෝදුපත් බැලීම් ආදී සියලු කටයුතු කළ බව සඳහන් කරමු.

**සැම දෙනාගේ ම යහපත් කල්පනා මුදුන් පත් වේවා!**

මීට; ලෝවැඩ කැමති,
**රේරුකානේ චන්දවිමල**
මහා නායක ස්ථවිරයෝ ය.

ශ්‍රී විනයාලංකාරාරාමය,
**පොකුණුවිට.**
26. 01. 78

**මෙම සම්පූර්ණ "බෝධි පූජාව" පොත පහත වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.**

**http://www.dhammikaweb.com/?p=3189**